# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,996 - 2016 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා - 2016.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වෙන කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව - 2017/2018 සඳහා ඇතුළත් කරගැනීමේ තරග විභාගය

2017/2018 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා (NVQ Level - 5) ඇතුළත් කරගැනීමේ තරග විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් 2017 ජනවාරි මාසය තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි දී පවත්වනු ලැබේ.

02. ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව (NVQ Level -5) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ ( NVQ 5) කෘෂිකර්ම විද්‍යාලවල පවත්වාගෙන යනු ලැබේ.

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව ගැහැණු, පිරිමි දෙපක්‍ෂයටම විවෘත වන අතර, පවත්වනු ලබන තරග විභාගයේ ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් කෘෂිකර්ම විද්‍යාල වල ඇති ධාරිතාවයට සරිලන ප්‍රමාණයක් තෝරා ගනු ලබයි.

2.2 විභාගය සමත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්‍ෂා කර බැලීමට පමණක් සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලබන අතර, එයට ලකුණු ලබාදීමක් සිදු නොකරයි.

2.3 මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලබයි.

2.4 මෙම පාඨමාලාව පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවක් වන බැවින් සියලුම පුහුණුලාභීන් ආයතනයේ පුහුණු කාල පරිච්ඡේදය තුළ අනිවාර්යයෙන්ම නේවාසිකාගාරවල නැවතී පුහුණුව ලබාගත යුතුය.

2.5 පුහුණු ආයතන තුළ වසරක පුහුණුවෙන් පසු, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ අධීක්ෂණය යටතේ නම් කරන ලද ආයතනයක් තුළ මාස 06ක රැකියාස්ථ පුහුණුවක යෙදීම අනිවාර්ය වේ.

2.6 ඉහත පුහුණුව සාර්ථකව අවසන් වූ පසු තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පුහුණුලාභීන් ඇගයීමට ලක් කොට ජාතික වෘත්තීය සුදුසුකම් NVQ Level - 05 මට්ටමේ සහතිකයක් ලබාදේ.

2.7 මෙම සහතිකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුලු අනෙකුත් කෘෂිකර්මයට සම්බන්ධ රජයේ ආයතනවල තාක්‍ෂණ සහකාර මට්ටමේ රැකියා සඳහා වන සුදුසුකමක් වේ.

03. පාඨමාලාවට ඇතුළත්වීමේ සුදුසුකම් :

3.1 සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ඨ සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබීම. (මෙහි දී එක් වරක දී විෂයන් 05ක් සමත්ව තිබිය යුතුය.);

සහ

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක්වත් සමත්වී තිබිය යුතුය. (උසස් පෙළ සඳහා ගණිත විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත්වී තිබීම මෙම පාඨමාලාව තෝරා ගැනීමේ සුදුසුකමක් ලෙස සළකනු නොලැබේ.);

හෝ

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී තාක්ෂණ වේදය විෂය ධාරාවේ ජෛව තාක්ෂණ වේදය, තාක්ෂණ වේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් තුන හදුරා එක් විෂයයක්වත් සමත්වී තිබීම.;

හෝ

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී තාක්ෂණ වේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණ වේදය, තාක්ෂණ වේදය සඳහා විද්‍යාව, හා කෘෂිකර්මය යන විෂයයන් තුන හදුරා එක් විෂයයක්වත් සමත්වී තිබීම.

3.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 25ට වඩා වැඩි නොවිය යුතුය.

3.3 කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව පහත සඳහන් ජාතික වෘත්තිය සුදුසුකම් 4(NVQ Level 4) මට්ටමේ පාඨමාලා හදාරා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිසම මගින් ලබාදෙන ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) සහතික ඇති අයදුම්කරුවන්ටද මෙම පාඨමාලාවට අයදුම් කළ හැක.

* පැල තවාන් සංවර්ධන සහායක
* ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
* උද්‍යාන අලංකරණ ශිල්පී

හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ජාතික වෘත්තීය සුදුසුකම් 4(NVQ 4) මට්ටමේ වෙනත් පාඨමාලා සාර්ථකව හදාරා තිබීම.

3.3.1 ඉහත ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් සාර්ථකව හදරා සහතික හිමි අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් ඃ

සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ට සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යයනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් එකකටවක් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතුය. (මෙහිදී එක් වතාවක දී විෂයන් 05ක් සමත්ව තිබිය යුතුය);

*සහ.*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පිළිගත් ආයතනයක ජාතික වෘත්තිය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ කෘෂිකර්ම ක්‍ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා සහතික පත්‍රලත් අයකු වීම.

3.3.2 මෙම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට වඩා නොවැඩි විය යුතුය.

3.3.3 මෙම අයදුම්කරුවන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් වෙනම තරග විභාගයක් පවත්වනු ලබන අතර, එයින් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් හට බඳවා ගැනීමට හැකි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 10% ක අවස්ථාවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. මෙම අයදුම්කරුවන් සඳහා විභාගය පවත්වන දිනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දෙනු ලැබේ.

04. පාඨමාලාවට අයදුම් කිරීම :

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර හෝ පරිගණක ගත කරගෙන 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතුය. (අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ.) එහි අංක 01 සිට අංක 07 තෙක් මුල් පිටුවේ ද, 8 සිට 11 දක්වා දෙවන පිටුවේ ද, 12 සිට 14 දක්වා තුන්වන පිටුවේ ද, ඉතිරිය 4 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්‍ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු/කාරිය විසින් වග බලාගත යුතු වේ. *ඉල්ලුම්* පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 700කි. අපේක්‍ෂකයා විසින් මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්ගේ "අංක 057100179027204" දරන ගිණුමට රු. 700 ක මුදලක් බැර කර ලබාගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අලවා එවීමට කටයුතු කළ යුතුය.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2017 ජනවාරි මස 02 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්‍ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2017/2018 එක් අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. විභාග මධ්‍යස්ථාන :

2017/2018 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2017 ජනවාරි මාසය තුළදී පහත සඳහන් නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ :-

| නගර අංකය | නගරය |
|---|---|
| 1 | ගම්පහ |
| 2 | අම්පාර |
| 3 | දඹුල්ල |
| 4 | ගාල්ල |
| 5 | හම්බන්තොට |
| 6 | කුරුණෑගල |
| 7 | මහනුවර |
| 8 | වවුනියාව |
| 9 | අනුරාධපුරය |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අපේක්‍ෂකයන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත මත අනුව හෝ අයදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර හෝ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 දෙසැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2016 දෙසැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.)

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

06. විභාග ක්‍රමය ඃ

6.1 තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ :

| | *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රය - 01 | කෘෂිකර්මය (ලකුණු 100 යි) (අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය). | පැය 1 යි | 10.00 පැය - 11.00 පැය |
| දෙවන ප්‍රශ්න පත්‍රය - 02 | බුද්ධි පරීක්ෂණය (ලකුණු 100යි) (රටා, සබඳතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ). | පැය 1 යි | 11.30 පැය - 12.30 පැය |

6.2 මෙහි 3.1, 3.2, 3.3.1 සහ 3.3.2 ඡේදයන්හි සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් කර පහත අ, ආ සහ ඇ හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (විභාග) වෙත ඔබගේ ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳව දැන්වීම වඩා ඵලදායී වනු ඇත ඃ-

(අ) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්,
(ආ) මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්,
(ඇ) අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායා පිටපතක්.

6.3 අයදුම්කරුවන් විසින් ලබාගත් ලකුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. ඉහත විභාගයේ විෂයයන් දෙකෙහි එකතුවෙහි වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අපේක්ෂකයා බඳවා ගැනීම සඳහා සුදුසුකමක් නොවන බව සැලකිය යුතුය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසුව හෝ යන කවර අවස්ථාවක දී වුව, මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

6.4 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

ආචාර්ය ආර්. ආර්. ඒ. විජේකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

*NVQ 5* මට්ටම කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා එක් අවුරුදු පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2017

Competitive Examination for Admission to one year course of National Diploma in Agricultural Production Technology in NVQ Level 5 - 2017

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

1.

| විභාගයට පෙනී සිටින නගරය | එහි අංකය ඃ |
|---|---|
| 1 වැනි තේරීම .................... | .................... |
| 2 වැනි තේරීම .................... | .................... |
| 3 වැනි තේරීම .................... | .................... |

(*ගැසට්* පත්‍රයේ මුල් ඡේදයට අනුව)

2.

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය: | |
|---|---|
| සිංහල මාධ්‍යය - 2 | |
| දෙමළ මාධ්‍යය - 3 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ

| | |
|---|---|
| පුරුෂ - 0 | |
| ස්ත්‍රී - 1 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා/තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන ☐
(3.1 ඡේදයට අනුව)

5. (*අ*) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(පැහැදිලි අකුරින්)
(ii) අගට යෙදූ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
*උදා.* ඃ ANANDA, K. C. B.

(*ආ*) (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

6. (i) සම්පූර්ණ ලිපිනය :————.
(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංක : (i) ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐
(ii) ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

7. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

8. (*අ*) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.
(*ආ*) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

9. උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

10. 2017.01.02 වැනි දිනට වයස : අවුරුදු ☐☐ මාස : ☐☐ දින : ☐☐

11. අධ්‍යාපන සුදුසුකම් ඃ (*ගැසට්* නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතු වේ.)
- *NVQ* 4 පාඨමාලාව හදාරා සුදුසුකම් ලැබූ අය සඳහා අදාළ නැත.

(අ)*ගැසට්* නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ආ) ගැසට් **නිවේදනයේ** 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබා ගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. සිංහල | | |
| | | 2. ගණිතය | | |
| | | 3. විද්‍යාව | | |
| | | 4. කෘෂිකර්මය | | |
| | | 5. සමාජ අධ්‍යයනය | | |
| | | 6. ඉතිහාසය | | |
| | | 7. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | | |
| | | 8. කෘෂි ආහාර තාක්ෂණය | | |
| | | 9. උද්‍යාන විද්‍යාව | | |

අ. පො. ස. (උ. පෙ.) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා ඇත් ද? ඔව්/නැත (අදාළ නොවන වචනය කපා හරින්න.)

(*ඇ*) *අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් සමත් විෂයයන්* :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්ම | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. ජෛවතාක්ෂණවේදය | | |
| | | 6. තාක්ෂණවේදය සඳහා විද්‍යාව | | |
| | | 7. ඉංජිනේරු තාක්ෂණවේදය | | |

(*ඈ*) ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න.
(මුල් පිටපත් එවිය යුතු නොවේ.)

අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :————.

12. NVQ මට්ටම් 4 පාඨමාලාව හදාරා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ඃ

(i) *අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල* ඃ

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ii) හදාරා ඇති NVQ මට්ටම් 4 පාඨමාලාව පිළිබඳ විස්තර ඃ
(*අ*) පාඨමාලාවේ නම :————.
(*ආ*) පාඨමාලාව හැදෑරූ ආයතනය :————.
(*ඇ*) NVQ සුදුසුකම් ලැබූ වසර (සහතිකවල පිටපතක් මේ සඳහා ඉදිරිපත් කළ යුතු ය.) :————.

(*iii*) අ. පො. ස. (උ. පෙළ.) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා ඇත්නම් එම ප්‍රතිඵල :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්ම | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. ජෛවතාක්ෂණවේදය | | |
| | | 6. තාක්ෂණවේදය සඳහා විද්‍යාව | | |
| | | 7. ඉංජිනේරු තාක්ෂණවේදය | | |

13. ජීව විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා සුදුසුකම් ඇති, NVQ 4 පාඨමාලාවෙන්ද සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පමණක් පහත කොටස අදාළ වේ.

ඔබ තෝරාගැනීමේ විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන්නේ NVQ 4 සුදුසුකම් ඇතුවද නැතහොත් උසස් පෙළ සුදුසුකම් මතද යන්න සඳහන් කරන්න. (අදාළ එක් කොටුවක පමණක් කතිරය යොදන්න.)

NVQ 4 පාඨමාලාවේ සුදුසුකම් මත ☐

උසස් පෙළ සුදුසුකම් මත ☐

14. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්)
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

15. *විභාග ගාස්තු පිළිබඳ විස්තර* :
15.1 මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට රු. 700 ක් බැර කර ලබාගත් කුවිතාන්සියේ අංකය :————.

15.2 මුදල් ගෙවන ලද මහජන බැංකු ශාඛාවේ නම :————.

මුදල් ගෙවූ කුවිතාන්සියේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.
එහි ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම ඔබ ළඟ තබාගන්න.

*අයදුම්කරුගේ ප්‍රකාශය* :
මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. අ. පො. ස. (සා. පෙළ.) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයන් හයෙන් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාව/තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා *ගැසට් නිවේදනයේ* නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,30,060 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයැදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා/මිය/මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, ***ගැසට් නිවේදනයේ* සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් සපුරා ඇති බවට *ගැසට් නිවේදනය* හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි.** තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන
සුදුසුකම් සහතික කරන අයගේ
නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

12-61

---

**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

සහකාර රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2016

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2017.01.02 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2017 මාර්තු මස කොළඹ දී පවත්වනු ලැබේ.

01. සුදුසුකම් :
(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය;
(ii) වයස අවුරුදු 23 ට නොඅඩු හා 65 ට නොවැඩි විය යුතුය;
(iii) අටවන ශ්‍රේණියට සුදුසුකම් ලැබීමේ විභාගය හෝ සමාන විභාගයක් සමත් විය යුතුය;
(iv) රියදුරු පාසලක සේවා නියුක්තිකයෙක් වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. සේවක අර්ථ සාධක අරමුදල් අංකය හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් අංකය ඇතුළත් වන ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද 2016/10/20 වැනි දින දක්වා සේවක භාර අරමුදල් අංකය හෝ සේවා අර්ථ සාධක අරමුදල් අංකය සහිත ලේඛන සලකනු නොලැබේ. ඔවුන් රියදුරු පාසලක සේවය කරන බවට පිළිගත හැකි ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.
(v) සහකාර උපදේශකයකු වීමට අවම වශයෙන් B, B1 හා A සඳහා අදාළ දිනට වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.
එසේ වුවද රියදුරු පාසලක සේවා නියුක්තිකයෙකු ලෙස පළපුරුද්ද ලබා ගත් වාහන පන්තිවලට අදාළව වසර 05 ට පෙර ලබා ගත් වලංගු රියදුරු බලපත්‍රයක් තමා සතු විය යුතුය.
(vi) තමා අදල වාහන පන්තිවල රිය පැදවීමට හා රිය පැදවීම පුහුණු කිරීමට සෞඛ්‍යමය අතින් සුදුසු බව ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක වෛද්‍ය නිළධාරියෙක් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.
(vii) රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ වෙනත් එවැනි ආයතනයක පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටින තැනැත්තකු හැර ඔහු හෝ ඇය එවැනි ආයතනයක සේවා නියුක්තිකයකු නොවිය යුතුය.

02. විභාග ක්‍රමය :
(I) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පවත්වනු ලැබේ.
(II) සියලුම ප්‍රශ්නපත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතුය. මුලදී ඉල්ලුම් කළ භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. විභාගයට අදළ විෂයයන්:- මෙම විභාගය මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ කොටස් දෙකකින් යුතු ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය.
(I) මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය I - කාලය පැය 02
(II) මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය II - කාලය පැය 02

04. විෂය නිර්දේශය :- මෙම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම මෝටර් වාහන පනත, මාර්ග නීති, මහාමාර්ගෝපදේශ සංග්‍රහය, ඉගැන්වීමේ හා උපදේශ දීමේ ක්‍රමවේද, ආරක්ෂිතව රිය පැදවීම, ආචාර ධර්ම, ප්‍රථමාධාර, කාර්මික හා තාක්ෂණික දැනුම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ.

05. (I) *තේරීමේ පටිපාටිය* :- එක් එක් විෂයකට අවම වශයෙන් 40% වන පරිදි සමස්ථ ලිඛිත විභාගයෙන් 40% ක් හෝ එයට වඩා ලකුණු ලබාගත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සහතික හා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් දෙසතියකට අඩුනොවන රියදුරු උපදේශක පාඨමාලාවකට සහභාගී විය යුතු අතර එය සාර්ථකව හැදෑරීමෙන් පසු, රියදුරන් පුහුණු කිරීමේ උපදෙස් ලබාදීම හා පුහුණුව ලබා දීම පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. එම පරීක්ෂණයෙන් 40% ක් ලබා ගන්නා අපේක්ෂකයින් සඳහා සහකාර උපදේශන බලපත්‍රය ලබා දෙනු ලැබේ.

(II) විභාග ප්‍රතිඵල : ලිඛිත පරීක්ෂණයෙන් 40% කට නොඅඩුව ලැබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල තැපැල් මගින් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.results.exams.gov.lk** වෙබ් අඩවියේ පල කිරීම මගින් දන්වනු ඇත.

06. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-
(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.27" x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයාම පිරවිය යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය. තවද ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය.
(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම විය යුතුය.
(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2017.01.02 වැනි දින හෝ ඊට කලින් ලැබෙනු පිණිස කොළඹ 05, ඇල්විටිගල මාවත, අංක 341, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව "සහකාර රියදුරු උපදේශකයින් බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබේ.
(ඈ) විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු. 2000 ක් වේ. මෙම මුදල මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 6000-0000-00-0013-0027-000 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.
(ඉ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිළධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිළධාරියෙකු හෝ රු. 2,40,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.
(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපැල් කිරීමේදී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.
(උ) අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචි කරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කල කුවිතාන්සිය සූදනමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

(අ) විභාගයේ නම :————.
(ආ) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(ඇ) ජා.හැ.අං. :————.
(ඈ) ලිපිනය :————.
(ඉ) ෆැක්ස් අංකය :————.
(ඊ) ඉල්ලුම්පත තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි කිරීමේ අංකය හා තැපැල් කාර්යාලය :————.
(උ) මුදල් ඇනවුමේ අංකය :————.

(ඌ) විභාග අපේක්ෂකයින් තම අත්සන සහතික කරවා ගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. විභාග ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් හට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත.

07.අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග පරීක්ෂකවරයා සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08.මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ 05, ඇල්විටිගල මාවත, අංක 341,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තු වේ දී ය.

**ආදර්ශ ඉල්ලුම්පත්‍රය**

*මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

DEPARTMENT OF MOTOR TRAFFIC

සහකාර රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2016

APPLICATION FOR A WRITTEN EXAMINATION FOR ASSISTANT DRIVING INSTRUCTOR REGISTRATION - 2016

- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐ සිංහල - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න) දෙමළ - 3
ඉංග්‍රීසි - 4

1. (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(*ආ*) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————
(උදා: GUNAWARDHANA, H.M.S.K.)

(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. (*අ*) ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*ආ*) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(*ඇ*) රියදුරු පාසලේ නම සහ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4. ස්ත්‍රී පුරුෂ භාවය : ☐ පුරුෂ - 0 (අදළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

5. ඉල්ලුම්කරුගේ වයස සහ උපන් දිනය :

(අ) වයස : ☐☐ උපන් දිනය : ☐☐☐☐ ☐☐ ☐☐

6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. පළපුරුද්ද :————.
(සනාථ කිරීමේ ලේඛන අමුණන්න)

8. (*අ*) විභාග ගාස්තුව රු.2000/- වන අතර එම මුදල ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(*ආ*) තමා රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ වෙනත් එවැනි ආයතනයක රියදුරන් පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටීමකදී හැර එවැනි ආයතනයක සේවා නියුක්තිකයකු නොවන බව දිවුරුම් සහතිකයක් මගින් තහවුරු කළ යුතුය. (විශ්‍රාම ගැනීමට මාස 06 ක කාලයක් ඉතිරිවී ඇති අයටද ඉල්ලුම් කළ හැකිය. ඔවුන්ගේ උපදේශක බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ විශ්‍රාම ගැනීමෙන් පසුවය).

ඉහත සඳහන් තොරතුරු මාගේ උපරිම දැනීමට අනුව සියලු ආකාරයෙන් නිවැරදි බව මම ප්‍රකාශ කර සිටිමි. තවද විභාගයපැවැත්වීමසම්බන්ධයෙන්විභාගකොමසාරිස්ජනරාල්විසින්පනවනුලබනනීතිරීතිවලටමමයටත්වනබවද ප්‍රකාශකරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

***අත්සන සහතික කිරීම***

මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ................................... මහතා/මහත්මිය/මෙනවිය ............................... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කල බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අමුණා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
12-23/1

**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2016

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2017.01.02 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2017 මාර්තු මස කොළඹ දී පවත්වනු ලැබේ.

01. සුදුසුකම් .- මෙම විභාගය සඳහා අයදුම්කරුවන් විසින් පහත දක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය :-
- (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;
- (ii) වයස අවුරුදු 23ට නොඅඩු හා 65 ට නොවැඩි විය යුතුය;
- (iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී හෝ සමාන විභාගයකදී ගණිතය හා භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සම්මාන දෙකක් සහිතව එකවර සමත්ව තිබිය යුතුය;
- (iv) (අ) උපදේශකයෙකු වීමට තමා ඉල්ලුම් කරනු ලබන්නේ යම් පන්තියකට අයත් වාහන සම්බන්ධයෙන්ද එම පන්තියේ වාහන සඳහා පහත දක්වෙන අයුරින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් දිනට යටත් පිරිසෙන් අවුරුදු 05කට පෙර ලබා ගත් වලංගු රියදුරු බලපත්‍රයක් ඔහුට/ඇයට තිබිය යුතුය.

| | | |
|---|---|---|
| "ඒ" පන්තියේ රියදුරු උපදේශක | - | "ඩීඊ" හෝ "සීඊ" සහ "ඒ" පන්ති සඳහා අදල දිනට වලංගු වූ රියදුරු බලපත්‍රය |
| "බී" පන්තියේ රියදුරු උපදේශක | - | "ඩී" හෝ "සී" සහ "ඒ" පන්ති සඳහා අදල දිනට වලංගු වූ රියදුරු බලපත්‍රය |
| "සී" පන්තියේ රියදුරු උපදේශක | - | "බී" " බී1'' සහ "ඒ" පන්ති සඳහා අදල දිනට වලංගු වූ රියදුරු බලපත්‍රය |

(ආ) සහකාර රියදුරු උපදේශකයෙකු වශයෙන් අයදුම් කරන දිනට වසර 5ක පළපුරුද්දක් සහිතව ඉහත සඳහන් පංතිවලට අයත් අදල දිනට වලංගු වූ රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.

- (v) තමා අදල වාහන පංතිවල රිය පැදවීමට හා රිය පැදවීම පුහුණු කිරීමට සෞඛ්‍යමය අතින් සුදුසු බවට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක වෛද්‍ය නිලධරයෙකු විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.
- (vi) රාජ්‍ය ආයතනයක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ වෙනත් එවැනි ආයතනයක පුහුණු කිරීමේ කාර්යයේ යෙදී සිටින තැනැත්තෙකු හැර ඔහු හෝ ඇය එවැනි ආයතනයක සේවා නියුක්තිකයෙකු නොවිය යුතුය.

02. විභාග ක්‍රමය :
- (I) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පවත්වනු ලැබේ.
- (II) සියලුම ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතුය. මුලදී ඉල්ලුම් කළ භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. විභාගයට අදළ විෂයන් : මෙම විභාගය මෝටර් රථ ප්‍රවාහන කළමණාකරණය පිළිබඳ කොටස් දෙකකින් යුතු ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය.
- (I) මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය I - කාලය පැය 02
- (II) මෝටර් රථ ප්‍රවාහන කළමනාකරණය II - කාලය පැය 02

04. විෂය නිර්දේශය : මෙම ප්‍රශ්න පත්‍රයට අදළ කොටස් දෙකෙහිම මෝටර් වාහන පනත, මාර්ග නීති, මහා මාර්ගෝපදේශ සංග්‍රහය, ඉගැන්වීමේ හා උපදේශ දීමේ ක්‍රමවේද, ආරක්ෂිතව රිය පැදවීම, ආචාර ධර්ම, ප්‍රථමාධාර, කාර්මික හා තාක්ෂණික දැනුම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

05. (I) තේරීමේ පටිපාටිය : එක් එක් විෂයකට අවම වශයෙන් 40% වන පරිදි සමස්ථ ලිඛිත විභාගයෙන් 40% ක් හෝ එයට වඩා ලකුණු ලබාගත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සහතික සහ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් දෙසතියකට අඩුනොවන රියදුරු උපදේශක පාඨමාලාවකට සහභාගී විය යුතු අතර එය සාර්ථකව හැදෑරීමෙන් පසු, රියදුරන් පුහුණු කිරීමේ උපදෙස් ලබා දීම හා පුහුණුව ලබා දීම පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. එම පරීක්ෂණයෙන් 40%ක් ලබා ගන්නා අපේක්ෂකයින් සඳහා උපදේශන බලපත්‍රය ලබා දෙනු ලැබේ.

උපදේශක පාඨමාලාව සඳහා නියම කරන ගාස්තු අයදුම්කරුවන් විසින් ගෙවිය යුතුය.

(II) විභාග ප්‍රතිඵල : ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයට ලකුණු 40% කට නොඅඩුව ලැබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල ඇතුලත් ලේඛනය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල තැපැල් මගින් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පල කිරීම මගින් දන්වනු ඇත.

06. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :
- (අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.27" x 11.69" (A4) ප්‍රමාණයේ කඩදසියක සකස් කර අපේක්ෂකයාම පිරවිය යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද, සඳහන් කළ යුතුය. තවද ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය.
- (ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම විය යුතුය.
- (ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2017.01.02. දින හෝ ඊට කලින් ලැබෙනු පිණිස කොළඹ 05, ඇල්විටිගල මාවත, අංක 341, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව " රියැදුරු උපදේශකයින් බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබේ.
- (ඈ) විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 2,000 ක් වේ. මෙම මුදල මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 6000-0000-00-0013-0027-000 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.
- (ඉ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිළධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිළධාරියෙක= හෝ රු. 240,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.
- (ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ.
- (උ) අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචි කරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කල කුවිතාන්සිය සූදනමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.
  - (i) විභාගයේ නම :————.
  - (ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
  - (iii) ජා.හැ.අංකය :————.
  - (iv) ලිපිනය :————.
  - (v) ෆැක්ස් අංකය :————.
  - (vi) ඉල්ලුම්පත තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි කිරීමේ අංකය හා තැපැල් කාර්යාලය :————.
  - (vii) මුදල් ඇනවුමේ අංකය :————.
- (ඌ) විභාග අපේක්ෂකයින් තම අත්සන සහතික කරවා ගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. විභාග ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් හට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතී රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතී රීතී උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට සිදුවනු ඇත.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව : තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග පරීක්ෂකවරයා සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත. :
- (i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත.
- (ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය. :

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ 05, ඇල්විටිගල මාවත, අංක 341,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්
දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

*මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

DEPARTMENT OF MOTOR TRAFFIC

*රියදුරු උපදේශකයින් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය - 2016*

APPLICATION FOR A WRITTEN EXAMINATION FOR DRIVING INSTRUCTOR REGISTRATION - 2016

● විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
(අදල අංකය කොටුව තුළ ලියන්න) දෙමළ - 3
ඉංග්‍රීසි - 4

1. (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. (උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
   (ආ) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (උදා: GUNAWARDHANA, H.M.S.K.)
   (ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
2. (අ) ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (ආ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
   (ඇ) රියදුරු පාසලේ නම සහ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]
4. ස්ත්‍රී/පුරුෂ භාවය : [ ] පුරුෂ - 0 ස්ත්‍රී - 1 (අදල අංකය කොටුව තුළ ලියන්න)
5. ඉල්ලුම්කරුගේ වයස සහ උපන් දිනය :
   (අ) වයස : [ | ] උපන් දිනය : [ | | | ] [ | ] [ | ]
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. පළපුරුද්ද :————.
   (සනාථ කිරීමේ ලේඛන අමුණන්න)

08. (එ) විභාග ගාස්තුව රු.2000/- වන අතර එම මුදල ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඒ) ~~තමා රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ වෙනත් එවැනි ආයතනයක රියදුරන් පුහුණු කිරීමේ~~ කාර්යයේ යෙදී සිටීමකදී හැර එවැනි ආයතනයක සේවා නියුක්තිකයකු නොවන බව දිවුරුම් සහතිකයක් මගින් තහවුරු කළ යුතුය.(විශ්‍රාම ගැනීමට මාස 06 ක කාලයක් ඉතිරිවී ඇති අයටද ඉල්ලුම් කළ හැකිය. ඔවුන්ගේ උපදේශක බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ විශ්‍රාම ගැනීමෙන් පසුවය).

ඉහත සඳහන් තොරතුරු මාගේ උපරිම දැනීමට අනුව සියළු ආකාරයෙන් නිවැරදි බව මම ප්‍රකාශ කර සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

**අත්සන සහතික කිරීම**

මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ................................... මහතා/මහත්මිය/මෙනවිය ............................... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කල බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අමුණා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

12-23/2

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මධ්‍යම හා උතුරු පළාත්වල දිස්ත්‍රික්ක සඳහා මාර්ග පිරවුම් කැට (Track Ballast) කියුබ් 2,250ක් සැපයීම

01. පහත සඳහන් ස්ථාන සඳහා මාර්ග පිරවුම් (Track Ballast) සැපයීම සඳහා, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන) සභාපති විසින් 2016.12.16 දින ප.ව. 02.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු පහත සඳහන් එක් එක් අයිතමයන් වෙනුවෙන් වෙන් වශයෙන් ඇගයීම් කර ප්‍රදානය කරනු ලැබේ.

| අයිතම | ස්ථානය | කියුබ් ප්‍රමාණය | සැපයුම් කාලය |
|---|---|---|---|
| 01. | අඹේපුස්ස දුම්රිය අංගනය | 250 | මාස 03 යි |
| 02. | මීරිගම දුම්රිය අංගනය | 500 | මාස 03 යි |
| 03. | අලව්ව දුම්රිය අංගනය | 500 | මාස 03 යි |
| 04. | වැල්ලව දුම්රිය අංගනය | 500 | මාස 03 යි |
| 05. | කුරුණෑගල දුම්රිය අංගනය | 500 | මාස 03 යි |

02. රු. 5000.00 ක ආපසු නොගෙවන ලංසු ගාස්තුවක් ගෙවා 2016.12.15 දින ප.ව.03.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත යුතු ලංසු ලේඛන මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

03. 2016.12.16 දින ප.ව. 02.00 ට ලංසු භාර ගැනීම අවසන් කෙරේ.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදුකරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට සහභාගි විය හැක.

05. සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදිය යුතුය :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලේඛන ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 2438078 / 2436818
ෆැක්ස් අංකය : 2432044
විද්‍යුත් ලිපිනය : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7433

12-196

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**පාවිච්චි කළ භාණ්ඩ විකිණීම සඳහා ලංසු කැඳවීම**

01. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් ප්‍රයෝජනයට ගත නොහැකි යැයි නිර්දේශ කොට ඇති පහත සඳහන් භාණ්ඩ විකිණීමට ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අදාළ ලංසු පත්‍ර කොළඹ 05 කිරුළ පාරේ අංක 150 පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් ලබා ගත හැකි වන අතර 2016 දෙසැම්බර් මස 16 වැනි දින ප. ව. 03.00 තෙක් කාර්යාල වේලාවන් හි දී අදාළ භාණ්ඩ ලැයිස්තුව හා භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි අතර භාණ්ඩ පරීක්ෂා කිරීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) ගේ අධීක්ෂණය යටතේ සිදු කළ හැකිය.

03. එක් එක් අයිතම සඳහා වෙන වෙනම සකස් කළ ලංසු පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙලවරේ ''අයිතම අංක ......'' යන්න සඳහන් කර, එක් එක් අයිතමය වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රුපියල් දහසක (රු. 1,000.00) තැන්පත් මුදලක් ලංසු සුරක්ෂණය වශයෙන් මෙම කාර්යාලයේ සරප් නිලධාරී වෙත 2016 දෙසැම්බර් මස 23 දින පෙ. ව. 10.00ට පෙර ගෙවා ලබා ගන්නා රිසිට්පතෙහි පිටපතක් අමුණා රිසිට්පත් අංකය ලංසු පත්‍රයේ සඳහන් කර පහත සඳහන් ලංසු භාර ගැනීම අවසන් කරන වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ඉහත ලිපිනයට එවිය හැකි වන අතර නැතහොත් ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය හැකිය.

04. භාණ්ඩ විකිණීමේ දී ඉදිරිපත් කරන ලංසුවේ වටිනාකමට අමතරව එදිනට පවතින වැට් බද්ද ද ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

05. ලංසු භාර ගැනීම 2016 දෙසැම්බර් මස 23 දින පෙ. ව. 10.00ට අවසන් කරන අතර එදිනම පෙ. ව. 10.05ට ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට සහභාගි විය හැක.

06. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කර ඇති ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර මෙම විකිණීම හා සබැඳි කරුණු පිළිබඳව සර්වේයර් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

විකිණීමට යෝජිත භාවිතා කරන ලද භාණ්ඩ වර්ග :-

01. මොනිටර
02. ප්‍රින්ටර
03. පරිගණක උපාංග
04. වානේ කබඩ්
05. ෆැක්ස් යන්ත්‍ර
06. ජී. පී. එස් උපකරණ හා උපාංග
07. ලැප්ටොප් පරිගණක
08. මැනුම් උපකරණ
09. අබිලි ද්‍රව්‍ය

සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය.

අංක 150, කිරුළ පාර,
කොළඹ 05.
දුරකතන අංක : 0112-368106, 0112-369014, 0112-369011 - දිගුව 248
ෆැක්ස් : 0112-368106

2016 දෙසැම්බර් මස 02 වැනි දින.

12-183

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - පේදුරුතුඩුව**

නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2016.12.10 වැනි දින පෙ. ව. 9.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

නිවේදනයයි.-

01. මෙහි පහත සඳහන් නඩු භාණ්ඩ කිසිවකු අයිතිවාසිකම් කියන්නේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර අයිතිවාසිකම් ඉදිරිපත් කර නඩු භාණ්ඩ ආපසු ලබාගත හැකිය.

02. ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා සහභාගි වන අය ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණිය යුතු ය. අධිකරණයේ රෙජිස්ට්‍රාර්-වරයාගේ අවසරය මත වෙන්දේසිය පටන් ගැනීමට පැය භාගයකට පෙර මහජනයා විසින් මෙම භාණ්ඩ නැරඹිය හැක.

03. ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණීමට තබා ඇති යම්කිසි භාණ්ඩයක වටිනාකමට මිළ නොලැබුනේ නම් වෙන්දේසියේ දී එම භාණ්ඩ ආපසු ලබා ගැනීමේ අයිතිය අධිකරණය සතු වනු ඇත.

04. විකුණනු ලැබූ භාණ්ඩවලට එවේලෙහිම මුදල් ගෙවා භාණ්ඩ වෙන්කළ යුතුයි. සෑම ගෙවීමක්ම මුදලින් ම ගෙවිය යුතු වන අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

පෙ. සිවකුමාර්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
පේදුරුතුඩුව.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | B - 397/15 | අංක අපැහැදිලි පාපැදිය | 1 |
| 2. | B -318/15 | 24011710 ලුමාලා පාපැදිය | 1 |
| 3. | B -319/15 | 69826559 ලුමාලා පාපැදිය | 1 |
| | | 56011923 ලුමාලා පාපැදිය | 1 |
| 4. | B - 409/15 | අංක අපැහැදිලි පාපැදිය | 1 |
| 5. | A - 34/16 | අංක අපැහැදිලි පාපැදිය | 1 |
| | | Glamour පාපැදිය | 1 |
| 6. | A - 219/15 | 680811126 ලුමාලා පාපැදිය | 1 |
| 7. | A - 220/15 | අංක SL 1301705 ලුමාලා පාපැදිය | 1 |
| 8. | A - 431/15 | 1103096 KD වර්ගයේ රේසින් පාපැදිය | 1 |
| | | අංක අපැහැදිලි ලුමාලා පාපැදිය | 1 |
| 9. | A - 432/15 | අංක අපැහැදිලි පැදිය | 1 |
| 10. | A - 433/15 | 147034 ලුමාලා පාපැදිය | 1 |
| 11. | A - 236/11 | 69258431 ලුමාලා පාපැදිය | 1 |
| | | අංක අපැහැදිලි ලුමාලා පාපැදිය | 1 |
| | | 69613521 ලුමාලා පාපැදිය | 1 |
| | | 30753869 ලුමාලා පාපැදිය | 1 |
| 12. | A - 184/15 | 57149993 ලුමාලා පාපැදිය | 1 |
| | | අංක අපැහැදිලි පැදිය | |
| 13. | 23906 | අංක 69909653 දරන අබලන් තත්ත්වයේ ඇති පාපැදිය | 1 |
| 14. | 24496 | 68J3741 පාපැදිය | 1 |
| | | 244226 ලුමාලා පාපැදිය | 1 |
| | | 69810508 ලුමාලා පාපැදිය | 1 |
| | | අංක අපැහැදිලි පාපැදිය | 1 |
| 15. | A - 108/15 | 5573133 ලුමාලා පාපැදිය | 1 |
බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක. 486C - ගලවිලවත්ත ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ හෝමාගම ග්‍රාමයේ පිහිටි ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද අංක 520001 දරන (කැඩැස්තර) මහ නාම පිඹුරේ ඉඩම් කට්ටි අංක 25 හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඉඩම් කැබලි 58 ට මායිම්, උතුරට : මෙහි ලොට් 61 නැගෙනහිරට : මෙහි ලොට් 57 දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : මෙහි ලොට් 59 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0503 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ මාර්ග අයිතින්ද, වෙනත් අයිතින්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 520001 දරන (කැඩැස්තර) මහ නාම පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 425/18 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 149/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඊ. ඒ. බී. එස්. ඒකනායක.
ගිණුම් අංක : 0069 5000 6445.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2016.09.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් දෙලක්ෂ හාරසිය දහ හතයි ශත අසූ එකක (රු. 5,200,417.81) මුදලද, 2016 සැප්තැම්බර් 08 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම පහක් (10.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2016.11.04 දින රජයේ ගැසට් පත්‍රයේ 2016.10.24 දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2016.12.30 දින පෙ.ව. 11.45 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවන් තුළ සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (GN අංක. 498) මලපැල්ල නැගෙනහිර ග්‍රාම නිළධාරී කොට්ඨාසය තුළ මලපැල්ල ග්‍රාමයේ පිහිටි "බටදොඹගහලන්ද හෝ ගලවිලලන්ද" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. බණ්ඩා යන අය විසින් සාදන ලද 2014 දෙසැම්බර් 15 දාතම හා අංක. 1778 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1289 දරන පිඹුරේ ලොට් 5 නැගෙනහිරට : අඩි 12 දැනට පවතින පාර දකුණට : අංක 1289 දරන පිඹුරේ ලොට් 7 සහ බස්නාහිරට : අඩි 15 දැනට පවතින පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතක් (අ. 0, රූ. 0 පර්. 17) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ මාර්ග අයිතින්ද, වෙනත් අයිතින්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 1778 දරන පිඹුරට අනුවය.

අංක 1778 දරන පිඹුරේ එකී ලොට් 6 මෙම ඉඩමේ නැවත මිනුමක් සහ උබ බෙදුමක් වන අතර එය පහතින් මැනවින් විස්තර කොට ඇත :-

එකී මලපැල්ල ග්‍රාමයේ පිහිටි "බටදොඹගහලන්ද හෝ ගලවිලලන්ද" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. එස්. නානායක්කාර යන අය විසින් සාදන ලද 1967 සැප්තැම්බර් 22 දාතම හා අංක 1289 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 5 නැගෙනහිරට : අංක. 784 දරන පිඹුරේ ලොට් B2 දකුණට : ලොට් 7 සහ බස්නාහිරට : ලොට් 9 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතක් අ. 0, රූ. 0 පර්. 17 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ මාර්ග අයිතින්ද, වෙනත් අයිතින්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක. 1289 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C114/128 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඩී. පී. ඒ. ජයසිංහ යන අය විසින් සාදන ලද 1959 අගෝස්තු මස 31 දාතම හා අංක. 1097 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 සහ අංක. 1289 දරන එකී පිඹුරේ නිරූපිත ලකුණුකොට ඇති ලොට් 9 මාර්ග වෙන්කිරීම දිගේ හා මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 149/3

---

**සෙලාන් බැන්ක් පී. එල්. සී. - දඹුල්ල ශාඛාව**

**1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඉතා වටිනා පදිංචියට/වග ාවට සුදුසු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කණ්ඩලම ගමේ පිහිටි 'පිහිල්ල මූකලාන' නමැති ඉඩමට බලයලත් මානක එල්. සිරිපාල විසින් 2012.01.03 වැනි දිනැති අංක 4107A දරන පිඹුරේ නිරූපිත ලොට් 1 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, වගාව ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය අ:01 පර්: 17.1

ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ද ලීමා විසින් සෙලාන් බැන්ක් පී. එල්. සී. නමින් ලියා සහතික කරන ලද 2014.07.03 වැනි දින අංක 1098 දරන බැඳුම්කරයන්හි සඳහන් වෙන් කර තැබීම් සහ සියලුම කොන්දේසිවලට යටත්ව
වෙන්කර තැබීම්.-

1. දේපල තුළ හෝ මත ඇති සියලුම ඛනිජවල හිමිකම (මෙම ප්‍රදානයෙහි එම පදයට සුවිශේෂ ගල් ඇතුළත් වේ) සහ කැණීමේ අයිතිය, සෙවීම, වැඩ, යම් එවැනි ඛනිජ ඉවත ගෙනයාම රජය රඳවා තබා ගනී.
2. මෙම දේපළට ඇති අයිතිකරුගේ හිමිකම් මෙම ප්‍රදානයේ දිනට පවත්නා යම් මාර්ග අයිතියකට හෝ වෙනත් පරවශතාවට යටත් වේ.

කොන්දේසි :

1. අයිතිකරු විසින් මෙම දේපළෙහි ගොඩබිම් විශේෂිතව මෙහි සඳහන් කළ හෙක්ටයාර 0.101 ක අතුරු බෙදූ ඒකකයන්ට අඩු ප්‍රමාණයේ බෙදූ කොටසක් නොවිකිණිය යුතු වේ. 2. අයිතිකරු විසින් මෙහි තුළ විශේෂිතව සඳහන් කරන ලද අවම කොටසට අඩු නොබෙදූ 1/4 කොටසක් නොවිකිණිය යුතුය. 3. මෙම දේපළෙහි, කොන්දේසි 1 හි සඳහන් කරන ලද අතුරු බෙදූ ඒකකයකට අඩු ප්‍රමාණයේ බෙදූ කොටසකට කිසිවකු හිමිකරුවකු නොවිය යුතුය. 4. මෙම දේපළෙහි, කොන්දේසි 2 හි විශේෂිතව සඳහන් කරන ලද අවම කොටසකට අඩු නොබෙදූ කොටසකට කිසිවෙකු හිමිකරුවෙකු නොවිය යුතුය. 5. දේපළ හෝ එහි ජල සම්පාදනය කළ හැකි යම් කොටසක් හෝ ඉදිකිරීමේ ක්‍රියාවලියේ දී දැනටමත් කරන ලද හෝ මින්පසු කරනු ලබන ජල සම්පාදන වැඩ මඟින් ජල සම්පාදනය වන්නේ නම් ජල සම්පාදනය වූ භූමි ප්‍රමාණ සම්බන්ධයෙන් හිමිකරු වාරිමාර්ග ආඥා පනතේ (පරිච්ඡේද 453) සහ ඒ යටතේ සැකසුණු යම් රීති පිළිපැදිය යුතු වේ. 6. ආණ්ඩුවේ ඒජන්තතුමාගේ ලිඛිත අවසරයක් සහ නියමිත බලධාරියාගෙන් බලපත්‍රයක් නොලබා හිමිකරු විසින් දේපළ තුළ හෝ මත ඛනිජ සම්පත් කැනීමක් හෝ සෙවීමක්, ගැනීමක්, පරිහරණය කිරීමක්, විකිණීමක් හෝ වෙනත් ආකාරයකින් ඉවත් කිරීමක් කළ යුතු නොවේ. 7. ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ලිඛිතව ලබා ගන්නා ලද පූර්ව අවසරයක් නොමැතිව දේපළ හෝ එයින් යම් කොටසක් ඔප්පුවකින් පැවරිය යුතු නොවේ.

මෙම දේපළ දඹුල්ල පදිංචි ආරච්චිගේ ප්‍රියන්ත ප්‍රනාන්දු, මල්ලිකා ආරච්චිගේ ශ්‍රියාලතා සහ හෙලපිටියගේ දෝන මදුෂිකා සඳමාලි හෙලපිටිය යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දේපළට පිවිසීම.- දඹුල්ල නගරයේ සිට මහනුවර මාර්ගයේ දඹුලු රජමහා විහාරය හන්දිය දක්වා පැමිණ වමට හැරී කණ්ඩලම පාරට පිවිස කි. මී. 06ක් පමණ කණ්ඩලම හන්දියට පැමිණ වම් දෙසට හැරී වැවල පාරට ඇතුළු වී කි. මී. 01 ක් පමණ වැවල ප්‍රධාන මාර්ගයේ ගමන් ගත් විට අදාළ දේපළ මෙම පාරේ වම් පසින් පිහිටා තිබේ.

2016 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින පෙ:ව: 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. යෝජනා සම්මුතිය සඳහා 2016.10.14 වැනි දින රජයේ ගැසට් පත්‍රයේද 2016.10.08 වැනි දින ඩේලිමිරර්, ලංකාදීප සහ 2016.10.05 වැනි දින තිනකුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු, 3 වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්), 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය, 5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500/=, 6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000/=, ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධානි (නීති) සෙලාන් බැන්ක් පී. එල්. සී., අංක 90, ගාළු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011-2456487/011-2456483/011-2456479,

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර,
මාවිල්මඩ - මහනුවර.

දුරකතන අංක : 071-4755974/071-8446374/077-7761706
දුරකතන අංක/ෆැක්ස් : 081-2210595.

12-131

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී**
1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේදී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ (කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත), ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල - මාබෝල නගර සභා සීමාව ඇතුළත වත්තල පිහිටා ඇති මීගමුව පාර, 1 වන පටුමග, වරිපනම් අංක. 5/13 දරන, ''ගොරකගහවත්ත සහ ගොරකාගහකුඹුර'' නැමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් සකසන ලද අංක. 5846 දරන වර්ෂ 2006 ජූනි මස 05 වැනි දිනැති පිඹුරෙහි ලොට් 3 ලෙස නිරූපිත නැවත මැන බෙදා වෙන්කරන ලද) බලයලත් මානක ඩී. පී. විමලසේන විසින් සකසන ලද අංක. 5846/ඒ දරන වර්ෂ 2006 අගෝස්තු මස 20 වැනි දිනැති ලොට් 7 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් එල් 125/70 යටතේ ලියාපදිංචි කර ඇත.

(බිම් ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 9) වර්ෂ 2016 ක්වූ දෙසැම්බර් මස 20 වැනි දින පෙ. ව. 10.00 ට

දේපළට පිවිසෙන මාර්ගය.- වත්තල හන්දියේ සිට මීගමුව පාර දිගේ මීටර් 100 ක් පමණ ගොස් LOLC ආයතනය පසු කර වමට හැරී ගුණසේකර ඇවනිවු දිගේ මීටර් 75 ක් පමණ ගොස් වමට හැරී පළවන පටුමග සහ පොදු පාර දිගේ මීටර් 125 ක් පමණ ගිය විට විෂයගත දේපලට පිවිසිය හැක.

නීල් ෂෙල්රින් පීටර්ස් විසින් කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.07.02 දිනැති අංක 140 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2015.02.19 දිනැති අංක 247 දරන ද්විතීයික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය - සඳහා 2016.11.18 වැනි දින ඩේයිලි නිවුස්, ලක්බිම, තිනක්කුරල් පුවත්පත් සහ එදින ගැසට් පතද බලන්න.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
(4) ප්‍රචාරක වියදම් ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු කළමණාකරු - ණය අයකරගැනීම් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකය : 011-4667230

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංකය : 011-3068185 ෆැක්ස් අංකය: 011-2572940.

12-173

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී**
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව මහ නගර සභා සීමාවේ, වරිපනම් අංක 22 බී, 1වන පටුමග, වැව පාර, බොරලැස්ගමුවේ පිහිටි කැකුණගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී එස් අලහකෝන් විසින් මැන සාදන ලද අංක 7110 සහ 2012.01.23 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1A ප්‍රමාණය (අ: 0 රූඩ්: 0 පර්: 12.27) පර්චස් දොළහයි දශම දෙකයි හතක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි නිවස ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. (මෙම ඉඩම බලයලත් මිනින්දෝරු එස් ඒ ඩබ්ලිව් පෙරේරා විසින් මැන සාදන ලද අංක 251 සහ 1993.07.04 දිනැති පිඹුරේ නිරූපිත ලොට් අංක 1හි නැවත මැනීමකි. ඉහත කී බොරලැස්ගමුවේ වැව පාරේ පිහිටි කැකුණගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී තම්බි විසින් මැන සාදන ලද අංක 103 සහ 1995.08.20 සහ 1995/09/10 දරන පිඹුර ප්‍රකාර කැබැලි අංක 7 දරන පාර සඳහා වෙන් කිරීම ප්‍රමාණය (අ: 0 රූඩ්: 0 පර්: 23.2) පර්චස් විසි තුනයි දශම දෙකක් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව් එම්. කේ. මිනෝලි ඈන්-මාරි අමිත්‍රි ප්‍රනාන්දු මලවාන විසින් සහතික කරන ලද අංක 231 සහ 2012.03.29 දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ඉහත උපලේඛනයේ හි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනාදායි වශයෙන් ගුත්තිල සරණගුප්ත කහවේවිතාන යන අය බන්ධනදායි වශයෙන්, කොළඹ 02 යූනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදායි විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2016 ක්වූ දෙසැම්බර් මස 19 වැනි දින පෙ. ව. 10.00 ට අදාළ දේපල පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම .- කොළඹ සිට හොරණ දක්වා B5 මාර්ගයේ බොරලැස්ගමුව හන්දිය තෙක් ගමන් කොට වමට ඇති මහරගම පාරට හැරෙන්න. එතැන් සිට තවත් මීටර 400 ක් පමණ ගමන් කළ විට දකුණට ඇති 1 වන පටුමඟට හැරෙන්න. එතැන් සිට තවත් මීටර 100ක් පමණ ගමන් කළ විට දකුණට හැරී තවත් මීටර 60ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ වරිපනම් අංක 22B දකුණු පසින් පිහිටා ඇත. දේපළට ප්‍රවේශය පොදු පාරකිනි.

ගෙවීම් කළ යුතු ආකාරය.- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01 ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02 ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03 වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04 පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05 ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06 ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07 නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000/.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.

දුරකතන 0114218743.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු - කොළඹ වාණිජ මහාධිකරණ
සහ දිසා අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන 077-3181891.

12-130

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 1347

MOD/DEF/21/RET/1056.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2016 අප්‍රේල් මස 04 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ජෙනරාල් ජගත් චන්ද්‍රලාල් පල්ලියගේ පක්ෂවීර, ආර්එස්පී, යූඑස්පී (නි/60078)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2016 අප්‍රේල් මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් ජගත් චන්ද්‍රලාල් පල්ලියගේ පක්ෂවීර, ආර්එස්පී, යූඑස්පී (නි/60078)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2016 අප්‍රේල් මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් ජගත් චන්ද්‍රලාල් පල්ලියගේ පක්ෂවීර, ආර්එස්පී, යූඑස්පී (නි/60078)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

12 - 54

---

2016 අංක 1348

MOD/DEF/2/01/ARF/RET/572.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2014 පෙබරවාරි මස 28 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් දිලන්ත චමින්ද අල්ගම, ආර්එස්පී, ශ්‍රීලයුවෙබ (නි/65521)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2014 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් දිලන්ත චමින්ද අල්ගම, ආර්එස්පී, ශ්‍රීලයුවෙබ (නි/65521)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

12 - 53

---

2016 අංක 1349

MOD/DEF/2/01/ARF/RET/568.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2014 මැයි මස 31 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ශාප්‍රිය මහේන්ද්‍රනාත් කුමාර සුරවීරආරච්චිගේ, ආර්එස්පී, ගැහේබ (නි/62701)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2014 ජූනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ශාප්‍රිය මහේන්ද්‍රනාත් කුමාර සුරවීරආරච්චිගේ, ආර්එස්පී, ගැහේබ (නි/62701)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

12 - 178

---

2016 අංක 1350

MOD/DEF/02/01/ARF/REM/855.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 පෙබරවාරි මස 27 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ඇල්ලලහේවාගේ දෙන් සිසිල් චන්ද්‍රිම හේවගේ, ආර්එස්පී, ශ්‍රීලංසිරෙ (නි/65457)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ඇල්ලලහේවාගේ දෙන් සිසිල් චන්ද්‍රිම හේවගේ, ආර්එස්පී, ශ්‍රීලංසිරෙ (නි/65457)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

12 - 52

---

2016 අංක 1351

MOD/DEF/2/01/ARF/RET/1071.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 නොවැම්බර් මස 23 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් දෙන් මොහාන් දුලන් දිනේෂ් මාධව වලාකුලුගේ, ආර්එස්පී, ගරෙ (නි/66006)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 නොවැම්බර් මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් දෙන් මොහාන් දුලන් දිනේෂ් මාධව වලාකුලුගේ, ආර්එස්පී, ගරෙ (නි/66006)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

12 - 57

---

2016 අංක 1352

MOD/DEF/2/01/ARF/RET/920.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 ඔක්තෝබර් මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් හංගිලි ගෙදර නිහාල් ආනන්ද, ශ්‍රීලයුයුබ (නි/64144)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

12 - 55

---

2016 අංක 1353

MOD/DEF/2/01/ARF/RET/830.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 මැයි මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක) සියඹලාගහ ගෙදර නිහාල් වික්‍රමසිංහ, ශ්‍රීලංසිරෙ (නි/69230)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

12 - 56

---

2016 අංක 1354

MOD/DEF/2/01/ARF/RET/1072/A.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2016 මාර්තු මස 05 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ජාලත් තන්ත්‍රිගේ චමිත් අසංක තන්ත්‍රිගේ, ගැහේබ (නි/68924)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

12 - 177

---

2016 අංක 1355

MOD/DEF/03/02/RNF/COM/I.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

*2016 ජූලි මස 30 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන් :*

1. වැඩ බලන උප ලුතිනන් (පනිසෞ) සූරිය විජේකෝන් ගුණවත් මුදියන්සේලාගේ සමන්ත විජේකෝන්, එන්ආර්ඩබ් 3915, ශ්‍රීලංනාහ
2. වැඩ බලන උප ලුතිනන් (පනිසෞ) සොලන් ආරච්චිගේ අජිත් පතිරණ, එන්ආර්ඩබ් 3916, ශ්‍රීලංනාහ
3. වැඩ බලන උප ලුතිනන් (නැකා) පිටිගල ආරච්චිලාගේ සමන් කුමාර, එන්ආර්එච් 3917, ශ්‍රීලංනාහ
4. වැඩ බලන උප ලුතිනන් (පනිසෞ) මානික්කුම් ජේඩිගේ තිලක් උපුල් කුමාර, එන්ආර්ඩබ් 3918, ශ්‍රීලංනාහ
5. වැඩ බලන උප ලුතිනන් (වි) මොරපිටියගේ කසුන් ලක්ෂිත මොරපිටිය, එන්ආර්ඊ 3919, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

12 - 51

---

2016 අංක 1356

D/AF/650.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

2009 ඔක්තෝබර් මස 27 වැනි දින සිට පහත නම් සඳහන් අයවලුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්වරුන් වශයෙන් අධිකාරියට පත් කිරීමටත්, එදිනම සිටම ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකොට ඇත.

පයිලට් ඔෆිසර් වෙදයාලගේ මංජුල ක්‍රිෂාන්ත වෙදගේ (02793) විද්‍යුත්/ඉංජි

පයිලට් ඔෆිසර් දිසානායක මුදියන්සේලාගේ ලක්ෂ්මන් ඥානසිරි ජයසේන (02794) විද්‍යුත්/ඉංජි

පයිලට් ඔෆිසර් මීගස්වත්තේ දිසානායක මුදියන්සේලාගේ රවින්ද්‍ර උදය බණ්ඩාර දිසානායක (02795) විද්‍යුත්/ඉංජි

පයිලට් ඔෆිසර් කදිරේසන් මෝහන චන්ද්‍රප්‍රකාශ් (02796) විද්‍යුත්/ඉංජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2010 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

12 - 179

# රජයේ නිවේදන

එප් (2) 2/64.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**
විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1492 | 2016.11.01 | ශාන්ත අන්තෝනි දේවස්ථානය | ඕපාත, මිණුවන්ගොඩ. | ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12 - 59/1

---

(එප් 2) 2/64.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**
ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1492
විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| *විස්තර* | *පිහිටීම - ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | *දිස්ත්‍රික්කය* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| ශාන්ත අන්තෝනි දේවස්ථානය | ඕපාත, මිණුවන්ගොඩ | උතුරු අළුත්කුරු කෝරළය | ගම්පහ | ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 11 වැනි දින බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

12 - 59/2

---

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**
කලාකරුවන් සඳහා වූ දයකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කලාකරු දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්බන්ධයෙනි. ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රයෙහි පෝෂණය උදෙසා සිය දායකත්වය ලබාදුන් කලාකරුවන් සඳහා සමාජ සුරක්ෂිතතාවයක් ලබාදීමේ අරමුණින් 2016 අයවැය යෝජනා ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ සමාජ ආරක්ෂණ මණ්ඩලය එක්ව කලාකරුවන් සඳහා වූ දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කරනු ලැබේ. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා රජය විසින් මූලික දායකත්වය සපයනු ලබන අතර, දායකයා විසින් ඉතිරි දායකත්වය දැරිය යුතු ය. මෙම යෝජනා ක්‍රමයට අදාළව අයදුම්කරුවන් බඳවා ගැනීමේ පටිපාටිය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

01. අවශ්‍ය සුදුසුකම් :
    - 1.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
    - 1.2 වයස අවුරුදු 23 ත් 55 ත් අතර කලාකරුවන්ට මේ සඳහා දායක විය හැකි අතර, වයස අවුරුදු 60 ඉක්ම වූ පසු මෙහි ප්‍රතිලාභීන් බවට පත් වේ.
    - 1.3 කලාකරුවෙකු බවට සංස්කෘතික නිලධාරි විසින් සහතික කොට ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් මගින් නිර්දේශය ලබා තිබීම. (නාට්‍යකරණය හා රංග කලා ශිල්පය, මූර්තිකරණය, ගායන ශිල්පය, චිත්‍ර ශිල්පය, කැටයම් කලාව, බෙර වාදනය, සංගීත භාණ්ඩ වාදනය, විවිධ නර්තන කලා, සිනමා කලා, සාම්ප්‍රදායික ශාන්ති කර්ම, විවිධ සැරසිලි කලා, තොරණ කලාව, ග්‍රන්ථකරණය හා ලේඛන කලාව, සාහිත්‍ය හා රසවින්දන කලා ශිල්ප, බෙර සහ සංගීත භාණ්ඩ නිර්මාණය සහ නිෂ්පාදනය, නර්තන මෙවලම් නිෂ්පාදන ශිල්පය, රූක් කලාශිල්පය, පිටපත් රචනය හා ගීත රචනය, තනු නිර්මාණ කලාව, සංගීත නිර්මාණය, කැමරාකරණය, පසුතල නිර්මාණ කලාව, වේෂ නිරූපන ශිල්පය, හඬ කැවීමේ ශිල්පය, රූපවාහිනී කලා ශිල්පය, වීදි නාට්‍ය ශිල්පය, නක්ෂත්‍ර සහ ජ්‍යොතිෂ්‍ය ශිල්පය යන කලා කටයුතුවල නිරතවන සහ ඒ වෙනුවෙන් සක්‍රීය ලෙස දායක වෙමින් සමාජ මෙහෙවරක යෙදෙන තැනැත්තන් "කලාකරුවා" යන අර්ථයෙහි පිහිටුවනු ලැබේ.)
    - 1.4 කලාකරුවෙකු ලෙස පූර්වාසන්න වසර 5 ක් තුළ කලාවට සක්‍රීය දයකත්වයක් සිදුකර තිබීම. මේ බව තහවුරු කර ගැනීම සඳහා ඔහු විසින් සිදුකළ කලා නිර්මාණයන් පිළිබඳ තොරතුරු ලබාඇති ඇගයීම් වේ නම් ඒ පිළිබඳ තොරතුරු ලබාගත යුතුය.
    - 1.5 රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුපක් නොලබන කලාකරුවෙකු වීම. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හා සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය දරන්නන්ට මෙම විශ්‍රාම වැටුප සඳහා අයදුම්කළ නොහැක.

02. ප්‍රතිලාභියාට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු පළමු විශ්‍රාම වැටුප් වාරිකය ගෙවනු ලැබේ. රජයේ දායකත්වය ලෙස හිමිවන රු. 50,000.00 ට සමානුපාතික වන මුදලක් ප්‍රතිලාභියාගේ අවසන් වාරිකවලින් හිලවු කරනු ලැබේ. මෙහි දී වයස අවුරුදු 35 ට අඩු කලාකරුවන් අනිවාර්යෙන්ම වයස අවුරුදු 60 දී මාසිකව අවම රු. 30,000.00 ක විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා දායක විය යුතුය. වයස අවුරුදු 36 සිට 55 දක්වා අයට සිය කැමැත්ත මත වයස අවුරුදු 60 දී මාසිකව රු. 3,000.00 හෝ ඊට ඉහළ අගයක් ගන්නා මාසික විශ්‍රාම වැටුපක් සඳහා දායක විය හැකිය. මෙම ක්‍රමයට දායකවන කලාකරුවන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වනතුරු අදළ වාරික ගෙවිය යුතුය.

03. දයකයාට වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුපක් ලබා දෙනු ලැබේ.
04. දයකයා විශ්‍රාමිකයකු ලෙස අවුරුදු 80 සම්පූර්ණ වීමට පෙර මියගිය හොත්,
    - 4.1 කලත්‍රයා ජීවත්ව සිටී නම් ඔහුට හෝ ඇයට විශ්‍රාමිකයාට වයස අවුරුදු 80 වන තෙක් විශ්‍රාම වැටුප ලබා දෙනු ලැබේ.
    - 4.2 කලත්‍රයා නොමැති නම් දයකයාගෙන් පසු ඔහුගේ 18ට වැඩි උරුමකරුවන්ට දයකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දයක මුදල හා පොලිය ආපසු ලබා දෙනු ලැබේ.

05. ස්ථිර අර්ධ අබලතාවයට පත්වූ විට වයස අනුව ගැලපූ පාරිතෝෂිකයක් සහ නියමිත පරිදි වාරික ගෙවනු ලැබේ.
06. ස්ථිර පූර්ණ අබලතාවයකට පත්වූ විට වයස අනුව ගැලපූ පාරිතෝෂිකය ශුද්ධ දයක මුදල සමඟ හෝ පූර්ණ අබලතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපක් ලබා දෙනු ලැබේ.
07. විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගිය හොත් ඔවුන්ගේ යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදෙනු ලැබේ.
08. වාරිකය ගෙවීම අතපසු වූ විට
    - 8.1 අනුයාත වාරික 10 ක් දක්වා සහන ලබා දේ. (ඒ අතර කාලය තුළ ප්‍රමාද ගාස්තුවක් සහිතව නැවත දයක විය හැකිය.)
    - 8.2 වාරික 10 කට වඩා ගෙවීම අතපසු වූ විට අදළ ප්‍රතිලාභියා යෝජනා ක්‍රමයෙන් ඉවත් කෙරේ.
    - 8.3 අදළ විශ්‍රාම වැටුප වෙනුවෙන් ගෙවිය යුතු මුළු මුදලින් 25% ක් ගෙවා ඇති විට දයකයෙකුට තවදුරටත් වාරික ගෙවිය නොහැකි නම් ඒ බව දන්වා සිය ගෙවූ වාරික නැවත ලබාගත හැකිය.
    - 8.4 ගෙවිය යුතු මුළු මුදලින් 75% ක් ගෙවා ඇති විට ගෙවා ඇති මුළු මුදලට සමානුපාතික වූ විශ්‍රාම වැටුපක් වයස අවුරුදු 60 න් පසු ලබාගත හැකිය.
09. ඉහත 8.2 හෝ 8.3 යටතේ දායකයෙකුට වාරික ගෙවීම අතපසු වූ අවස්ථාවල දී රජය විසින් දරන ලද රු. 50,000.00 ක දයකත්ව මුදල එම ප්‍රතිලාභියාට අහිමි වේ. අදළ මුදල නැවත රජය වෙත අයවිය යුතු අතර, වෙනත් සුදුසුකම්ලත් ප්‍රතිලාභියෙකුට ප්‍රතිලාභ සැළසීමට අදළ මුදල යොදගනු ලැබේ.
10. තව ද ඉහත 8.2 හා 8.3 යටතේ වරක් යෝජනා ක්‍රමයෙන් ඉවත්කරන ලද ප්‍රතිලාභියෙකු නැවත යෝජනා ක්‍රමයට බඳවා ගැනීම සිදු නොකෙරේ.
11. මෙහි ඇමුණුම 01 යටතේ දක්වා ඇති අයදුම්පත මේ සඳහා යොදගත යුතු අතර, ඒ සමග ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද අයදුම්කරුගේ උප්පැන්න සහතිකයෙහි හා ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.

මේ සමග දක්වා ඇති ඇමුණුම 02හි සඳහන් ක්‍රමය මත දයකයන් විසින් සමාජ ආරක්ෂණ මණ්ඩලය වෙත වාරික ගෙවිය යුතු අතර ඇමුණුම 03හි ඉහත 08 ඡේදයේ සඳහන් පාරිතෝෂික ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳව සඳහන් වේ.

ඉහත සඳහන් උපදෙස් ප්‍රකාරව සුදුසුකම් ලත් කලාකරුවන් වෙතින් නිසි පරිදි සම්පූර්ණ කර ලබාගත් අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

අනුෂා ගෝකුල ප්‍රනාන්දු,
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
8 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

දුරකථන අංක : 0112-2872031, 011-2882592

ඇමුණුම 01

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**
***කලාකරු දයකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) :- ..............................................................
..............................................................මයා/මිය/මෙනවිය

02. (I) මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..............................................
(II) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) : ..............................................

03. අයදුම්කරුගේ ලිපිනය : ..............................................................

04. උපන් දිනය : වර්ෂය : .................................. මාසය : ...............................දිනය : ..........................................

05. වයස (2016.11.15 දිනට) : අවුරුදු : ..................................... මාස : ............................. දින : .................................
.

06. උප්පැන්න සහතිකයේ අංකය හා ලියාපදිංචි කළ දිනය : ..............................................
..

07. හැඳුනුම්පත් අංකය : .......................................... හැඳුනුම්පත නිකුත් කළ දිනය : ..............................................

08. දිස්ත්‍රික්කයඃ..............................................................

09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..............................................................

10. අයදුම්කරුගේ කලා ක්ෂේත්‍රය : ..............................................................
..............................................................

11. අයදුම්කරුගේ වෙනත් කලා ක්ෂේත්‍ර : ..............................................................

12. අයදුම්කරුගේ රැකියාව : ..............................................................

13. අයදුම්කරුගේ මාසික ආදායම : ..............................................................

14. අයදුම්කරුට රජයෙන් ලැබෙන වෙනත් දීමනා ඇත්නම් සඳහන් කරන්න : ..............................................

15. විවාහක/අවිවාහක බව : ..............................................................

16. කලත්‍රයා පිළිබඳ විස්තර : ..............................................................
(I) කලත්‍රයාගේ නම : ..............................................................
(II) කලත්‍රයාගේ උපන් දිනය : ..............................................................
(III) කලත්‍රයාගේ හැඳුනුම්පත් අංකය : ..............................................................
(IV) කලත්‍රයාගේ රැකියාව : ..............................................................
(V) කලත්‍රයාගේ මාසික ආදායම : ..............................................................

17. දරුවන් පිළිබඳ විස්තර :

| *නම* | *උපන් දිනය* | *වයස (2016.11.15 දිනට)* | *රැකියාව* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනුම ප්‍රකාරව සත්‍ය හා නිවැරදි බවත්, මා දැනට රජය හෝ පෞද්ගලික අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් නොලබන බවත් මෙයින් සහතික කරමි.

..............................................................
අයදුම්කරුගේ අත්සන.

*ප්‍රාදේශීය/ දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරීගේ සටහන*

අයදුම්කරු මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථිර/තාවකාලික පදිංචි අයෙකි. ඔහු/ඇය වසර............ක සිට කලා කටයුතුවල නියැලුනු/නියැලෙන කලාකරුවෙකි. ඉහත සඳහන් කර ඇති තොරතුරු පරීක්ෂා කළෙමි. ඔහු/ඇය වෙනත් රජයේ විශ්‍රාම වැටුපක් නොලබන අතර, ඔහු/ඇය කලාකරුවන් සඳහා වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දයකත්වය ඉල්ලා ඉදිරිපත් කරන ලද අයදුම්පත අදල සුදුසුකම් සපුරා ඇතිබව සහතික කරමි.

..............................................................,
සංස්කෘතික නිලධාරි.

දිනය : ..............................................................

*ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය :*

කලාකරු දයකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ඉදිරිපත් කර ඇති මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සුදුසුකම්වල නිවැරදිභාවය පරීක්ෂා කළෙමි. මෙම අයදුම්පත නිර්දේශ කරමි.

..............................................................,
ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්.

දිනය : ..............................................................

*සැ.යු.*- සෑම අයදුම්පතක් සමගම කලාකරුවාගේ ප්‍රායෝගික කලා කටයුතු හඳුනාගැනීමට හැකිවන පරිදි ලිඛිත සාක්ෂි වශයෙන් සැලකීමට හැකි ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා තිබිය යුතුය. මේ සඳහා කලාකරුවාගේ නියෝජනය දක්වෙන සහතිකපත්, තහවුරු කිරීමේ ලිපි, සම්මාන පිළිබඳ තොරතුරු සමරු කලාප පිටුවල ඡායා පිටපත්, ඡායාරූප, ඇගයීමේ ලිපි, සේවා සහතික, පුවත්පත් වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කළ හැකිය. කිසිදු ලිපියක හෝ ලේඛනයක මුල් පිටපත් එවිය යුතු නොවේ. ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික්ක ලේකම් මගින් සහතික කරන ලද ඡායාපිටපත් පමණක් සැපයීම ප්‍රමාණවත් වේ.

මේ සමඟ පහත ලියවිලි අමුණා තිබිය යුතුය.

* උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්
* ජාතික හැඳුනුම්පතෙහි සහතක කළ ඡායා පිටපතක්

ඇමුණුම 02

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**
**"සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**

| වයස අවුරුදු | මාසික විශ්‍රාම වැටුප (රු.) | මාසික වාරික මුදල (රු.) | මාසික වාරික සංඛ්‍යාව | ත්‍රෛමාසික වාරික මුදල (රු.) | ත්‍රෛමාසික වාරික සංඛ්‍යාව | වසර 25ක් තුළදී වාර්ෂික වාරික 25කින් (රු.) | වසර 20ක් තුළදී වාර්ෂික වාරික 20කින් (රු.) | වසර 15ක් තුළදී වාර්ෂික වාරික 15කින් (රු.) | වසර 10ක් තුළදී වාර්ෂික වාරික 10කින් (රු.) | වසර 05ක් තුළදී වාර්ෂික වාරික 05කින් (රු.) | එකවර ගෙවන්නේ නම් මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 23 | 1000 | 50 | 444 | 150 | 148 | 625 | 650 | 725 | 875 | 1425 | 5800 |
| 24 | 1000 | 60 | 432 | 170 | 144 | 675 | 700 | 775 | 975 | 1550 | 6300 |
| 25 | 1000 | 60 | 420 | 180 | 140 | 725 | 775 | 850 | 1050 | 1700 | 6900 |
| 26 | 1000 | 70 | 408 | 200 | 136 | 800 | 850 | 925 | 1150 | 1850 | 7500 |
| 27 | 1000 | 80 | 396 | 220 | 132 | 875 | 925 | 1025 | 1250 | 2025 | 8200 |
| 28 | 1000 | 80 | 384 | 240 | 128 | 950 | 1000 | 1100 | 1375 | 2200 | 8900 |
| 29 | 1000 | 90 | 372 | 260 | 124 | 1025 | 1100 | 1200 | 1475 | 2400 | 9700 |
| 30 | 1000 | 100 | 360 | 290 | 120 | 1125 | 1200 | 1325 | 1625 | 2625 | 10600 |
| 31 | 1000 | 100 | 348 | 300 | 116 | 1225 | 1200 | 1450 | 1775 | 2850 | 11600 |
| 32 | 1000 | 110 | 336 | 330 | 112 | 1350 | 1425 | 1575 | 1925 | 3125 | 12600 |
| 33 | 1000 | 130 | 324 | 370 | 108 | 1475 | 1550 | 1700 | 2100 | 3400 | 13800 |
| 34 | 1000 | 140 | 312 | 400 | 104 | 1600 | 1675 | 1875 | 2300 | 3700 | 15000 |
| 35 | 1000 | 150 | 300 | 450 | 100 | 1750 | 1850 | 2025 | 2500 | 4050 | 16400 |
| 36 | 1000 | 170 | 288 | 490 | 96 | | 2000 | 2255 | 2750 | 4425 | 17900 |
| 37 | 1000 | 190 | 276 | 550 | 92 | | 2200 | 2425 | 3000 | 4825 | 19500 |
| 38 | 1000 | 210 | 264 | 610 | 88 | | 2400 | 2650 | 3275 | 5275 | 21300 |
| 39 | 1000 | 230 | 252 | 680 | 84 | | 2625 | 2900 | 3575 | 5750 | 23300 |
| 40 | 1000 | 260 | 240 | 750 | 80 | | 2875 | 3175 | 3900 | 6275 | 25400 |
| 41 | 1000 | 290 | 228 | 840 | 76 | | | 3475 | 4250 | 6875 | 27800 |
| 42 | 1000 | 320 | 216 | 940 | 72 | | | 3800 | 4650 | 7500 | 30300 |
| 43 | 1000 | 360 | 204 | 1060 | 68 | | | 4175 | 5100 | 8200 | 33100 |
| 44 | 1000 | 400 | 192 | 1190 | 64 | | | 4575 | 5575 | 8975 | 36200 |
| 45 | 1000 | 440 | 180 | 1290 | 60 | | | 5000 | 6100 | 9800 | 39600 |
| 46 | 1000 | 500 | 168 | 1470 | 56 | | | | 6700 | 10750 | 43300 |
| 47 | 1000 | 500 | 156 | 1470 | 52 | | | | 6700 | 10750 | 43300 |
| 48 | 1000 | 570 | 144 | 1680 | 48 | | | | 7325 | 11750 | 47400 |
| 49 | 1000 | 650 | 132 | 1940 | 44 | | | | 8050 | 12875 | 51800 |
| 50 | 1000 | 760 | 120 | 2250 | 40 | | | | 8825 | 14125 | 56800 |
| 51 | 1000 | 810 | 108 | 2410 | 36 | | | | | 15475 | 62200 |
| 52 | 1000 | 960 | 96 | 2860 | 32 | | | | | 16975 | 68200 |
| 53 | 1000 | 1160 | 84 | 3450 | 28 | | | | | 18650 | 74800 |
| 54 | 1000 | 1430 | 72 | 4240 | 24 | | | | | 20500 | 82000 |
| 55 | 1000 | 1800 | 60 | 5350 | 20 | | | | | 22550 | 90100 |

රු. 1000/= විශ්‍රාම වැටුපකට අදාළ තොරතුරු ඉහත දක්වා ඇති අතර, ඔබගේ කැමැත්ත හා හැකියාව අනුව රු. 3000/= ක අවම විශ්‍රාම වැටුපකට යටත්ව ඔබට අවශ්‍ය විශ්‍රාම වැටුපක් ලබා ගත හැක.

ඇමුණුම 03

**අබලතාවය හා මරණය සිදු වූ විට ගෙවීම් සිදු කිරීමේ ක්‍රමවේදය**

| I වැනි තීරය | II වැනි තීරය | III වැනි තීරය | IV වැනි තීරය | V වැනි තීරය |
|---|---|---|---|---|
| යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී උපන් දිනයට වයස (අවුරුදුවලින්) | අබලතාවය හෝ මරණය සිදු වන විට වයස | ස්ථිර වශයෙන් පූර්ණ අබාධිත තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය | ස්ථිර වශයෙන් අර්ධ අබාධිත තත්ත්වයක් ඇති වූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය | මරණය සිදු වූ අවස්ථාවක එකවර ගෙවන පාරිතෝෂිකය |
| | අබලතාවය හෝ මරණය සිදුවන අවස්ථාවේ ඊළඟ උපන් දිනයට වසය | රු. ශත | රු. ශත. | රු. ශත |
| 18 සිට 54 දක්වා | 18 සිට 33 දක්වා | 50,000.00 | 25,000.00 | 25,000.00 |
| | 34 සිට 43 දක්වා | 40,000.00 | 20,000.00 | 20,000.00 |
| | 44 සිට 51 දක්වා | 30,000.00 | 15,000.00 | 15,000.00 |
| | 52 සිට 56 දක්වා | 20,000.00 | 10,000.00 | 10,000.00 |
| | 57 සිට 60 දක්වා | 16,000.00 | 8,000.00 | 8,000.00 |
| 55 සිට 59 දක්වා | සාමාජිකත්වය ප්‍රදානය කළ දිනයේ සිට දායක මුදල් ගෙවීමේ කාල සීමාවේ අවසානය දක්වා වූ කාල සීමාව තුළ | 12,000.00 | 6,000.00 | 6,000.00 |

12 - 76

---

**2016/2017 මහ කන්න රැස්වීම් තීරණ - අඹේවෙල ව්‍යාපාරය**

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹේවෙල ව්‍යාපාරයේ 2016/2017 මහ කන්නය සඳහා කන්න රැස්වීම 2016.11.10 වැනි දින අඹේවෙල වාරිමාර්ග ඒකක කාර්යාලයේ දී පවත්වන ලද අතර එහි දී පහත තීරණ ගන්නා ලදී.

1. වගා කරන බිම් ප්‍රමාණය - අක්කර 940
2. වගා කරන බෝගය - වී සහ මිශ්‍ර එළවළු
3. ඇල වේලි ශුද්ධ කිරීමේ අවසන් දිනය - 2016.11.01 සිට 20 වැනි දින දක්වා
4. පළමු ජල මුරය නිකුත් කිරීම - 2016.11.21
5. බිම් සකස්කර අවසන් කරන දිනය - 2016.12.03
6. දෙවන වර ඇල වේලි ශුද්ධ කිරීම - 2017.02.05
7. අවසන් ජල මුරය නිකුත් කිරීම - 2017.04.15
8. අස්වනු නෙළා අවසන් කළ යුතු දිනය - 2017.05.01
9. ඇල වේලි ශුද්ධ නොකරන අයට දඩ මුදල - මීටර් 10කට රු. 1,000
10. අවශ්‍යතාවය අනුව මුර ජල ක්‍රමය ක්‍රියාත්මක වේ.

12 - 122

---

**I කොටස : I ඡෙදය යටතේ පළවන විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්**
**2016.12.02 වැනි දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk